# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2194/56 - 2020 සැප්තැම්බර් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2020.09.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* බිය 3/1/1/500 - අදියර 2.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාබිම ගමෙහි පිහිටි ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද මු.පි.ගම් 4190 සහ 2020.07.08 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 සිට 06 දක්වා පෙන්නුම් කෙරෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2129 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි හය (06).

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: මීගහවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නා: කේ. ඒ. ඩී. අල්පෝන්සු කැලිස්ටස්, අංක 29/3, මාබිම, හෙයියන්තුඩුව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0209 (අ. 0, රූ. 0, පර්. 8.3).

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: මීගහවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන්නා: කේ. ඩී. සරත් කුමාර, එච්. යූ. පී. නදීශා දර්ශනී, අංක 29/1, මාබිම, හෙයියන්තුඩුව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0147 (අ. 0, රූ. 0, පර්. 5.8).

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: ගොන්නගහවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත, ළිඳක කොටසක් ඇත; හිමිකම් කියන්නා: එම්. කේ. බී. එම්. අල්විස්, අංක 79, ගෝතමී පාර, කොළඹ 08; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0366 (අ. 0, රූ. 0, පර්. 14.5).

04. **කැබලි අංක 04**
ඉඩමේ නම: ගොන්නගහවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන්නා: එම්. කේ. බී. එම්. අල්විස්, අංක 79, ගෝතමී පාර, කොළඹ 08; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0355 (අ. 0, රූ. 0, පර්. 14.0).

05. **කැබලි අංක 05**
ඉඩමේ නම: කෝන්ගහවත්ත *නොහොත්* ගලබඩවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: පන්සල්වත්ත, මනුබිලක කොටසක් ඇත; හිමිකම් කියන්නා: පූජ්‍ය ඇලකාකේ සංඝරක්ඛිත හිමි, ශ්‍රී ශෛලතලාරාමය, මාබිම, හෙයියන්තුඩුව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0331 (අ. 0, රූ. 0, පර්. 13.1).

06. **කැබලි අංක 06**
ඉඩමේ නම: හල්ගහවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන්නා: මාර්ෂල් කහඳ, අංක 29/2, මාබිම, හෙයියන්තුඩුව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0721 (අ. 0, රූ. 0, පර්. 28.5).



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ඉහත සඳහන් ඉඩමට පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියකියවිලිවලින් බලයලත් අයවලුන් පහත සඳහන් දිනයන්හි දී පහත සඳහන් වේලාවට බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

| *දිනය* | *වේලාව* | *කැබලි අංක* |
|---|---|---|
| 2020.10.19 | පෙ.ව. 9.30 | 01 |
| | පෙ.ව. 11.00 | 02 |
| | ප.ව. 2.00 | 03 |
| 2020.10.20 | පෙ.ව. 9.30 | 04 |
| | පෙ.ව. 11.00 | 05 |
| | ප.ව. 2.00 | 06 |

තවද 2020.10.12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් 02ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

එස්. ඒ. චන්දිමා සූරියආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
බියගම.

සපුගස්කන්ද, මාකොළ,
බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-350

**නිවැරදි කිරීමේ දැන්වීමයි**

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මීරි/ප්‍රා.ලේ/ඉ/3.

මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා රජයට ඉඩම් අත්කර ගැනීම - අදියර II, කැඩැස්තර සිතියම් අංක 510345 (10/3) හි කැබලි අංක 161.

ඉහත කරුණට අදාළව 2020.08.13 දිනැති අංක 2188/38 දරන *ගැසට් පත්‍රයෙහි* පළ වූ ශුද්ධි පත්‍රිකාවේ අදාළ කැබලි අංකය සඳහන් නොවූ බැවින් එම කැබලි අංකය ඇතුළත්ව සංශෝධනය පහත පරිදි විය යුතුය.

"කැබලි අංක 177

ඉඩමේ නම: කහටගහවත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් පාන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: ජී. ලලිතා පද්මිනි හා මනෝරා සිරි කාන්ති; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0161."

ප්‍රාදේශීය ලේකම්,
මීරිගම.

2020 සැප්තැම්බර් මස 18 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මීරිගම.

10-351

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.